# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2281/37 - 2022 මැයි මස 27 වැනි සිකුරාදා - 2022.05.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා පනත

1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වන වගන්තිය සමග කියවිය යුතු 41 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග.

රොෂාන් රණසිංහ (පා.ම.),
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය.

2022 මැයි මස 26 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

කලින් කළ සංශෝධිත 2016 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 1990/23 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග පහත දැක්වෙන පරිදි 2022 වර්ෂයට පමණක් අදාළව මෙයින් සංශෝධනය කරනු ලැබේ.

01. 2016 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 1990/23 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ iii වන උපලේඛනයේ ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනවල ව්‍යවස්ථාවට අදාළ විධිවිධාන යටතේ (අ) ඡේදයේ "මැයි මස තිස් එක් වන දින" යන වචන ඉවත් කොට "අගෝස්තු මස තිස් එක් වන දින" යන වචන ආදේශ කිරීමෙන්.

02. 2023 වර්ෂයේ ජනවාරි මස පළමු වැනි දින සිට නැවතත් 2016 ඔක්තෝබර් මස 27 වැනි දින අංක 1990/23 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ iii වන උපලේඛනයේ ජාතික ක්‍රීඩා සංගම්/සම්මේලනවල ව්‍යවස්ථාවට අදාළ විධිවිධාන යටතේ (අ) ඡේදය නැවත වලංගු වනු ඇත.

EOG 05-0140

1A - G 36826 — 08 (2022/05)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.